# සිංහල පද්‍ය සාහිත්‍යයේ චූල සම්ප්‍රදාය

*( මහනුවර - මාතර ජන කවි සාහිත්‍යය පිළිබඳ සාහිත්‍ය - සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් )*

යූ.පී. හර්සත් ඩයස්.

ශ්‍රී ලංකාවේ කැලණිය විශ්වවිද්‍යාලයේ
ආචාර්ය උපාධි පරීක්ෂණය සඳහා
ඉදිරිපත් කෙරෙන නිබන්ධය.

2001 මැයි.

## සාර සංග්‍රහය

සිංහල සාහිත්‍ය වංශයේ මහනුවර හා මාතර සාහිත්‍ය යුගයන්හි ජනකවි සාහිත්‍යය, සාහිත්‍ය - සමාජ විද්‍යාත්මක දෘෂ්ටියකින් අවලෝකනය කෙරෙන මෙම පර්යේෂණාත්මක නිබන්ධයේ දී සිංහල ජන සාහිත්‍ය සම්ප්‍රදාය හැඳින්වීම සඳහා චූල සම්ප්‍රදාය යන නම භාවිතයට ගැනිණි. ඒ කෙරෙහි ඉවහල් කර ගන්නා ලද්දේ රොබට් රෙඩ්ෆීල්ඩ් නම් සමාජ / මානව විද්‍යාඥයා විසින් ගැමි සමාජ වර්ගීකරණයේ දී යොදා ගත් සංකල්පයයි. සමාජ වර්ගීකරණය සඳහා යොදාගත් සංකල්පය සාහිත්‍යය සම්බන්ධයෙන් එකසේ අර්ථවත් වන්නේ සාහිත්‍යය: සමාජ සංස්කෘතියේ දර්ශකයක් වන බැවිනි. ඒ අනුව පළමු පරිච්ඡේදයෙන් සිංහල සාහිත්‍යයේ චූල සම්ප්‍රදාය හඳුන්වන ලද අතර පර්යේෂණ ක්ෂේත්‍රය හා සම්බන්ධ යුග බෙදුම නව අර්ථ කථනයකට ලක් කළෙමි. මෙතෙක් දේශපාලනික වශයෙන් වූ රාජධානි බෙදීම මත සාහිත්‍යයික යුග බෙදා දක්වන ලද නමුදු වඩා යෝග්‍ය ලෙස පෙනෙන්නේ සමාජ පරිවර්තනය මගින් සාහිත්‍යයික ප්‍රවර්ධනයන් සිදු වූ කාල පරිච්ඡේද වෙන් කොට ගැනීම බැව් පැහැදිලි කර පර්යේෂණ ක්ෂේත්‍රයට අදාළ මහනුවර හා මාතර සාහිත්‍ය යුග හැඳින්වීමට ලක් කළෙමි.

ජන කවි සාහිත්‍යය, සාහිත්‍ය සම්ප්‍රදායන්හි සමාරම්භක ප්‍රවණතාව වන අතර එකී ප්‍රවණතාව ජාතියක ආරම්භයත් සමග ඇරඹෙයි. ඒ අනුව සිංහල සාහිත්‍යයේ ජනකවි සම්ප්‍රදායේ උපත හා වර්ධනය මහනුවර මාතර කාලාවධිය දක්වා දෙවන පරිච්ඡේදයෙන් විමසුමට ලක් කෙරේ. මේ විමසුමේ දී ලංකා ඉතිහාසයේ ඒ ඒ දේශපාලන අවධීන්හි ගොඩ නැගී වරෙක යටපත් වෙමින් හා වරෙක ඉස්මතු වෙමින් පැවති ජන කාව්‍ය නිර්මාණ හා එහි අන්තර්ගත සමග බැඳී ගිය සමාජ පසුබිම හඳුනා ගැනීමට උත්සාහ දැරිණි.

තුන්වන පරිච්ඡේදයේ දී මහනුවර - මාතර සාහිත්‍ය යුගයන්හි චූල සම්ප්‍රදාය ඉස්මතුවීමට හේතු කාරක වූ දේශපාලන - සමාජ - ආගමික හා ආර්ථික පසුබිම විග්‍රහයට ලක් කෙරිණි. සමස්ත රාජ්‍යය ඒකඡත්‍ර කොට මුළු රට පුරා සිය අණසක පතුරුවන බලගතු රජුන් දවස සාහිත්‍යයේ මහා සම්ප්‍රදාය ඉස්මතු වන අතර, රජුගේ පාලන බලතල බෙදී ගිය මහජනතාවට බලය හිමිවන පාලන තන්ත්‍රයක් යටතේ ජන සාහිත්‍යයේ ප්‍රභාව හඳුනාගත හැකිවෙයි. මෙහි දී මහනුවර - මාතර ජන සාහිත්‍යයික ප්‍රභාවට හේතු කාරක වූ දේශපාලන සාධකය එය ම බැව් හඳුනා ගැනිණි.

18 -10- 2001

අනතුරු ව සිව්වන පරිච්ඡේදයෙන් මහනුවර හා මාතර සාහිත්‍ය යුගයන්හි ජන කාව්‍ය සාහිත්‍යය හඳුනා ගැනීමට උත්සාහ කළ අතර මේ වූ කලී ඉමක් නොදැකිය හැකි තරමේ පුළුල් ක්ෂේත්‍රයක් විය. තත් යුගයන්හි කියූ හා පසු ව ලේඛනගත වූ ජනකවි සාහිත්‍යය කිසිසේත් එක්තැන් කළ නොහැකි තරමට පුළුල් වෙයි. එහෙයින් සාහිත්‍ය - සමාජ විද්‍යාත්මක විමර්ශනයකට තරම් වන ලෙසින් ජන සාහිත්‍යයේ ලිඛිත පද්‍ය සාහිත්‍යය ඒ ඒ රජවරුන් යටතේ එක් තැන් කළ අතර එහි දී නිශ්චිත ව කාල නියමය දැක්විය හැකි නිර්මාණ කෙරෙහි පමණක් අවධානය යොමු කළෙමි. අනතුරු ව ඒ මත පිහිටා මහනුවර හා මාතර සාහිත්‍ය අවධීන්හි ජන කවියාගේ අරමුණු හඳුනා ගැනීමට උත්සාහ දරන ලද අතර එමැ අරමුණු පාදක කොට ජන කවි සාහිත්‍යය පිළිබඳ වර්ගීකරණයක් යෝජනා කළෙමි.

සමාජ වර්ගීකරණයේ දී රොබට් රෙඩ්ෆීල්ඩ් ගැමි සමාජය හා නාගරික සමාජය අතර පවත්නා අන්තර් සම්බන්ධතා ව විග්‍රහයට ලක් කළ අතර එමැ ධර්මතා ව සාහිත්‍ය නිර්මාණයන් කෙරෙන් ද එකසේ පළ වන බව හඳුනා ගැනීමත්, ඒ අනුව මහා සම්ප්‍රදායේ හා චූල සම්ප්‍රදායේ අන්තර් සම්බන්ධතාව චූල සම්ප්‍රදාය කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ අවධානයෙන් පස්වන පරිච්ඡේදයේ දී විග්‍රහයට ලක් කෙරිණි.

සාහිත්‍යය, සමාජ ප්‍රවේග විසින් මෙහෙයවනු ලබන්නකි. සමාජ ප්‍රවේග කෙරෙහි රටක සාමාජික, සංස්කෘතික, ආර්ථික, දේශපාලනික හා ආගමික සංසිද්ධි හේතු කාරක වෙයි. ඒ අතරිනුදු දේශපාලන සාධකය ම ප්‍රධානත්වයට වැටේ. දේශපාලන ක්‍රියාවලිය මඟින් රටක සමාජ සංස්කෘතික පරිවර්තන කාර්යයන් තීරණය කෙරෙන අතර මහනුවර, මාතර කාලාවධීන් විමසුමට ලක් කිරීමේ දී ගම දක්වා බලය විමධ්‍යගත කළ ග්‍රාම රාජ්‍ය පාලන ක්‍රමයක පැවැත් ම එකී කාල පරිච්ඡේදයන්හි සාහිත්‍යයේ චූල සම්ප්‍රදායේ ප්‍රභාවට හේතු කාරක වූ බව හඳුනා ගැනිණි.

- - -